# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,777 - 2012 සැප්තැම්බර් 21 වැනි සිකුරාදා - 2012.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1458 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1460 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ඔක්තෝබර් 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 සැප්තැම්බර් මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2012 ජුනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


1457 - B 80649— 7,100 (2012/09)
F 1 –

# තනතුරු - ඇබෑර්තු

## උඩපළාත ප්‍රාදේශීය සභාව

2012.08.10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* (පළාත් පාලන IV(ආ) කොටස) උඩපළාත ප්‍රාදේශීය සභාවේ කාර්යාල කාර්ය සහායක/මාර්ග කම්කරු/සනීපාරක්ෂක කම්කරු තනතුරු සඳහා බඳවා ගැනීමේ *ගැසට්* නිවේදනයේ අංක 06 යටතේ සඳහන් අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය 2012.09.15 දක්වා දීර්ඝ කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. සී. ද සිල්වා,
ලේකම්,
උඩපළාත ප්‍රාදේශීය සභාව.

2012ක් වූ සැප්තැම්බර් මස 03 වැනි දින,
දැල්පිටිය, අටබාගේ,
උඩපළාත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

09-588

---

## හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව

හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (ප්‍රාදේශීය සභාවේ අනියම් හා ආදේශක සේවයේ නියුක්ත අයට විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.)

| *තනතුර* | *තනතුරු ගණන* | *වැටුප් පරිමාණය මාසික (රා.ප.ච. 6/2006 ivඅනුව)* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| මාර්ග කම්කරු | 06 | PLI-2006A<br>රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
(ii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
(iii) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් හඟුරන්කෙත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය. (ඡන්දහිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් විසින් කරන සහතිකයකින් සනාථ විය යුතු ය.)
(iv) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (එහෙත් දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු තැනැත්තන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
(vi) රජයේ පළාත් පාලන සේවයේ සහ සංස්ථා සේවයේ, සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු ය.
(vii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරීන්ට තනතුරු සඳහා ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පූර්වාසන්න අවුරුදු 05ක කාලය තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දින ලබා ගත්තා වූ ද සතුටුදායක සේවා කාලයක් තිබිය යුතු ය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

තනතුරු සඳහා කුසලතා හා සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

04. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක යුතු ය.
(ii) පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොන්දේසි හා රෙගුලාසිවලට ද, පළාත් පාලන ආයතනවලට අදාළ ආඥාපනත්/පනත්වල විධිවිධාන වලට ද, හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතු ය.

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

06. *සේවා කොන්දේසි* :

6.1 *සාමාන්‍ය කොන්දේසි* .- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ II වැනි පරිච්ඡේදයේ 10 වැනි හා 12 වැනි උපවගන්තිවල සඳහන් විධිවිධාන වලට අදාලවේ.

6.2 *භාෂා ප්‍රවීණතාවය* .- සෑම නිලධාරියෙකුටම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වැනි පරිච්ඡේදයේ විධිවිධාන හා රජයේ භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිලා කලින් කල පනවනු ලබන නීති හා රෙගුලාසි ව්‍යවස්ථා ද පිළිපැදිය යුතුය.

07. *ඉල්ලුම්කරන ආකාරය* .- අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිලියෙල කරන ලද අයදුම්පතක් 2012.10.31 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ - "ලේකම්, හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "............................................ (තනතුරේ නම)තනතුර සඳහා අයදුම්පත'' යනුවෙන් සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල හඟුරන්කෙත ප්‍රාදේශය ලේකම් සතු වේ.

සම්මුඛ පරීක්ෂණය සඳහා පහත ලියවිලි ඉදිරිපත් කළ යුතුවේ :

01. උප්පැන්න සහතිකය,
02. අධ්‍යාපන සහතිකය,
03. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,
04. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිලධාරිගේ විය යුතුය.)
05. පළපුරුද්ද පිළිබඳ සහතිකයක්.

ඩී. එම්. විජේරත්න,
ලේකම්,
හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව.

2012 සැප්තැම්බර් මස 04 වැනි දින,
හඟුරන්කෙත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2012**

**....................................................... *තනතුර සඳහා අයදුම්පත***

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :———————.
මුලකුරු වලින් හැඳින්වෙන නම් :———————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :———————.
03. ස්ථිර ලිපිනය :———————.
04. උපන් දිනය : වර්ෂය :————— , මාසය:————— , දිනය:————— .
05. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු:———————, මාස:———————, දින:———————.
06. ජාතික හැඳුනුම්පත් අංකය:———————.
07. ස්ත්‍රී/පුරුෂ භාවය:———————.
08. විවාහක/අවිවාහක:———————.
09. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචිවීමෙන්ද ?:———————.
10. අධ්‍යාපන සුදුසුකම් සමත් වූ විභාග පිළිබඳ විස්තර :———————.
11. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුය):———————.
12. සේවා පළපුරුද්ද :———————.
13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? :———————.
14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය සහ විස්තර, එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික) :———————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

———————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

මෙම අයදුම්කරු වන....................................... මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ... ...................................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක බවත්, ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූළ දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව, මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

—————————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා
හෝ බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

නම:—————————.
පදවි නාමය:—————————.
දෙපාර්තමේන්තුව/ආයතනය :—————————.
දිනය :—————————.

09-656

---

# පළාත් පාලන නිවේදන

## විල්ගමුව ප්‍රාදේශීය සභාව

සම්මත අතුරු ව්‍යවස්ථාව පිළිගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 සිට 126 දක්වා වූ වගන්ති වලින් 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2(3) වගන්තියෙන් පනවා ගැනීමට ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර බලය ලැබෙන්නාවූ ද, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියෙන් පළාත් පාලන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ද අනුව, ඔහු විසින් සම්පාදනය කර, අංක 520/7 හා 1988.08.23 දින දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කර ඒ බව අංක 607 හා 1990.04.20 දින දරන *ගැසට් පත්‍රයේ* නිවේදනයක් මගින් පිළිගනු ලැබුවාවූ ද, සම්මත අතුරු ව්‍යවස්ථා අංක 01 සිට 42 (21 වැනි අතුරු ව්‍යවස්ථාව හැර) දක්වා කාණ්ඩ, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවෙන දින සිට වලංගු වන සේ පිළිගැනීමට විල්ගමුව ප්‍රාදේශීය සභාවේ 2012.02.28 දින පැවැත්වූ සභා රැස්වීමේදී සම්මත වූ යෝජනාවක් මඟින් තීරණය වී ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. එම්. ජේ. කේ. වීරසේකර,
සභාපති,
විල්ගමුව ප්‍රාදේශීය සභාව.

2012ක් වූ අගෝස්තු මස 15 වැනි දින,

09-469

---

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**

134(1) වගන්තිය යටතේ

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය යටතේ තමන්කඩුව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2010 ජුලි මස 29 වැනි දින පැවැති ප්‍රාදේශීය සභා රැස්වීමේදී සම්මත කරගෙන ඇති මෙහි උපලේඛනයේ සඳහන් යෝජනාවෙන් කියවෙන ප්‍රදේශය 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සමග කියවිය යුතු 1955 අංක 22 දරන පනතින් සංශෝධිත 1946 අංක 57 දරන පළාත් පාලන (පරිපාලන ප්‍රදේශ) ආඥා පනත සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් මා විසින් අනුමත කළ බව ප්‍රකාශයට පත් කරමි.

විරාජ් මර්වින් පෙරේරා,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
පොළොන්නරුව.

පළාත්පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,
පොළොන්නරුව.

**උපලේඛන**

***යෝජනාව***

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තියට අනුව තමන්කඩුව ප්‍රාදේශීය සභා බල සීමාවේ**

*උතුරට :*

හබරණ මඩකලපුව ඒ 11 මාර්ගයේ (තමන්කඩුව හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව ආසන්නයේ) කුඹුක්කන් ආරු හි මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂයේ සිට කුඹුක්කන් ආරුවෙහි මධ්‍ය රේඛාවේ උතුරට ගමන් කොට කුඹුක්කන් ආරු හා කොළඹ මඩකලපුව ප්‍රධාන දුම්රිය මාර්ගය හමුවන ඡේදනය වන ලක්ෂය දක්වා පැමිණ එම දුම්රිය මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ මඩකලපුව දෙසට ගමන් කොට හමුවන පරාක්‍රම සමුද්‍රය 1 ඇළ (කුරුඳුවත්ත හන්දිය) දක්වා පැමිණ එම ඇළ 1 ඇළ මාර්ගයේ මධ්‍ය රේඛාවේ වමට හැරී මීටර් 500ක් පමණ පහලට ගොස් හමුවන නෝට් ඇළ පාර හෙවත් කුමාරස්වාමි වාඩිය පාර මධ්‍ය රේඛාව දක්වා ද ( වම් පසට මීටර් 100ක් ද අයත් වනසේ) එතැන සිට එම කුමාරස්වාමි වාඩිය පාරේ මධ්‍ය රේඛාවේ සිට වම් පසට මීටර් 100ක් ද අයත් වන සේ ගමන් කොට පොළොන්නරුව තඹාල පාරේ හමුවන එල්බී ඇළ මාර්ගයේ මධ්‍ය රේඛාවට ගමන් කොට එම ඇළ මාර්ගයේ ඉහළට හෙවත් දකුණට හැරී වම්පසට මීටර් 100ක්ද අයත් වනසේ ගමන් කොට එම ඇළ පාරේ පළමු බෙදුම් ඇළ මාර්ගයේ මධ්‍ය රේඛාවේ ගල්කොරිය පාර හමුවන ස්ථානය දක්වා පැමිණ එම පාරේ හමුවන ප්‍රධාන ඇළෙහි වම් ඉවුරේ අතුරු මාර්ගයේ (වම් පසට මීටර් 100ක් ද අයත් වනසේ) මධ්‍ය රේඛාවේ ගමන් කොට මොණරතැන්න හංදිය දක්වා පැමිණ එම පාරේ වමට හැරී (මීටර් 100ක් වම් පසට අයත් වනසේ) මධ්‍ය රේඛාවේ ගමන් කොට මොණරතැන්න පාරේ අතුරු බෙදුම් ඇළ හමුවන ස්ථානය දක්වා ගමන් කොට හමුවන දමන පාර දක්වා ගොස් දකුණට හැරී එම දමන පාරේ මධ්‍ය රේඛාවේ සිට (මීටර් 100ක් වම් පසට අයත් වනසේ) සේවාගම ඕනෑගම ප්‍රධාන පාර දක්වා ද වේ.

*නැගෙනහිරට :*

එතැන් සිට එම ප්‍රධාන පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු පසට හෙවත් ඉහළට (වම් පසට මීටර් 100න් අයත් වන සේ) තුනේ ඇළ හංදිය දක්වා පැමිණෙන්නේය. එතැනින් වමට හැරී එම තුනේ ඇළ පාරේ මධ්‍ය රේඛාවේ සිට මීටර් 100ක් වම් පසට අයත් වන සේ කාළිංග ඇළ පාරේ කදුරුවෙල පළුගස්දමන ප්‍රධාන මාර්ගය දක්වා පැමිණ එතැනින් වමට හැරී ( මීටර් 100ක් වම් පසට අයත් වන සේ) එම පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ බටතුන දක්වා පැමිණ එම බටතුන හමුවන සීමාවේ කුණු ඇළෙහි මධ්‍ය රේඛාව දක්වා පැමිණ එම මධ්‍ය රේඛාව පමණක් ඉදිරියට යොදා ගනිමින් ගල්ලැල්ල විල හෙවත් විල්ලුවේ ජල ගැල්ම ප්‍රාදේශය මායිම් වන සේ 182-නෙළුම්විල, 187- ගල්ලැල්ල, 188 ගල්ලැල්ල බටහිර යන ග්‍රාම නිලධාරි වසම් වල නැගෙනහිර සීමාවෙන් ගොස් හබරණ - මඩකලපුව ඒ 11 ප්‍රධාන පාරේ කොටලීය බෝක්කුව හෙවත් පාලම දක්වා ද වේ.


*දකුණට :*

එතැන් සිට එම කොටලීය ඇළ මාර්ගයේ මධ්‍ය රේඛාවේ ඉහළට අඹංගඟ දක්වා ගමන් කිරීමේ දී හමුවන අළුත්වැව පිටවාන් ඇළ හෙවත් කුණු ඇළ හමුවන ස්ථානය දක්වා ගොස් එම ඇළ පාරේ ඉහළට අළුත්වැව පිටවාන ඇළ බැම්ම දක්වා පැමිණ එම ඇළ පාරේ මධ්‍ය රේඛාවේ වමට හැරී (වම් පසට මීටර් 100ක් ද අයත් වනසේ) රණවිරු මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ ගමන් කොට ආර් බී 1 ඇල මාර්ගය දක්වා පැමිණ එම ඇළ බැම්ම පාරේ මධ්‍ය රේඛාවේ (වම් පසට මීටර් 100ක් අයත් වනසේ) ගණන්ගොල්ල හන්දිය දක්වා පැමිණ එතැනින් වමට හැරී ගණන්ගොල්ල පාරේ මධ්‍ය රේඛාවේ (වම්පසට මීටර් 100ක් අයත් වනසේ) ගොස් හමුවන කුඹුරු පාරේ දකුණට හැරී එහි මධ්‍ය රේඛාව ඔස්සේ (වම් පසට මීටර් 100ක් ද අයත් වනසේ) පරාක්‍රම සමුද්‍රය වැව් බැම්මෙහි කොලොන් ගහ හන්දිය දක්වා ද වේ. (කලහගල නවනගරය පාරේ හන්දියේ බුදු පිළිමය අසල සිට කි. මී. 01ක් වන ස්ථානය)

බටහිරට :

එතැන් සිට එම වැව් බැම්මේ කොලොන් ගස් හන්දියේ සිට දකුණු පසට වැවේ ගිල්ම සීමාවේ හෙවත් වැව් වාන් සීමාව ඔස්සේ ( මා ඔය පාරේ 11 මාර්ගයේ සිට කි. මී. 1.4ක් වන සේ) වැවේ කඩක්කරය දක්වා පැමිණ එතැන් සිට මා ඔය කඩවල වැව පාර හන්දියෙන් කඩවල වැව පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ (වම් පසට මීටර් 100ක් අයත් වන සේ ගොස්) කඩවල වැව දෙසට ගොස් හමුවන ජනපදගම පාරට පැමිණ එම පාරේ මධ්‍ය රේඛාවේ සිට වම් පසට මීටර් 100ක් අයත් වන සේ කඩවල වැව සුසාන භූමිය හතරමං හන්දිය දක්වා පැමිණ එතැනින් දකුණට හැරී එම පාරේ මධ්‍ය රේඛාවේ (වම් පසට මීටර් 100ක් අයත් වන සේ) මීටර් 100 ක් පමණ ඉදිරියට ගොස් හමුවන කඩවල වැව ප්‍රධාන මාර්ගයට හමුවන 1493 ජනපද ඉඩමේ මායිම දක්වා ගොස් වම්පසින් හමුවන ඩී 2/6 ඇළ පාරේ මධ්‍ය රේඛාවේ වමට හැරී වෙල මැදින් වැටී ඇති ( කුඹුරු ඉඩම් හරහා) පාරේ 1401 ජනපද ඉඩමේ මායිම අසලින් 23 කණුව කඩවල වැව පාරට පැමිණ එම පාරේ දකුණේ හමුවන වතුර ටැංකිය ඉදිරිපිට මාර්ගයේ නිකවැව ගාමිණී විද්‍යාල මාර්ගයට පිවිස එම පාරේ මධ්‍ය රේඛාවේ ආරම්භක ලක්ෂය වූ කුඹුක්කන් ආරු පාලම දක්වා වන මායිම් සීමාවට ඇතුළත් වන PO/TK2008/035 දරන මිනින්දෝරු සැලැස්මෙන් දක්වන භූමි ප්‍රදේශය දියුණු ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සුදුසු යැයි ගරු සභාපති ප්‍රේමසිරි මුණසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

## තමන්කඩුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයෙහි වරිපනම් සීමාව දැක්වෙන අනුරේඛනය PO/TK/2008/035




පරිමාණය 1: 50000

ගම : නිශ්ශංකමල්ලපුර වීරපෙදෙස
බැද්දිවැව, පොත්ගුල් පෙදෙස
ඇතුමල්පිටිය, ගල්ලෑල්ල බටහිර
සිරිසගබෝ පෙදෙස, නිකවැව
ගණන්ගොල්ල, මාණික්කම්පට්ටිය
පුලතිසි පෙදෙස, උඩවෙල
මහවැලි පෙදෙස, තෝපාවැව
පලුගස්දමන උතුර, ගල්තඹරාව
කුරුප්පු හන්දිය, නෙලුම්විල
මහසෙන් පෙදෙස, ගල්ලෑල්ල
මොණරතැන්න, සේවාගම
නිශ්ශංකමල්ල පෙදෙස
පලුගස්දමන දකුණ, කඩවලවැව
පලුගස්දමන 1 ඇළ, සමුද්‍රාගම
පලුගස්දමන 2 ඇළ, කොටලීය
පලුගස්දමන 3 ඇළ

සුළු කොට්ඨාසය : මැද පත්තුව

ප්‍රා.ලේ. කොට්ඨාශය : තමන්කඩුව

දිස්ත්‍රික්කය : පොළොන්නරුව

පළාත : උතුරු මැද

යොමුව
මාර්ගය (මාසංඅ) : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය)

**පානදුර ප්‍රාදේශීය සභාව**

2013 වර්ෂයට අදාලව වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියෙන් පානදුර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2012 වර්ෂයේ ජූලි මස 31 වැනි දින පවත්වන ලද පානදුර ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ඩබ්. සුනේත්‍රලාල් ප්‍රනාන්දු,
සභාපති,
පානදුර ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පානදුර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුලත පිහිටි තන්තිරිමුල්ල උපකාර්යාල බල ප්‍රදේශයට අයත් සියලු නිවාස, ගොඩනැගිලි, ඉඩම්, ගෙපත්වල 2007 වර්ෂයේ සිදුකරන ලද තක්සේරුවේ වාර්ෂික වටිනාකම මත 2013 වර්ෂයට වරිපනම් බද්දක් පනවා අය කිරීමටත්, එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපල මත ඉහත කී වාර්ෂික වටිනාකමින් නේවාසික දේපල ස්ථාන සඳහා 6%ක් ද, ව්‍යාපාර පවත්වන ලද දේපල ස්ථාන සඳහා 10%ක් ද, වශයෙන් වරිපනම් බදු පනවා අයකල යුතු බවටත් යෝජනා කරමි.

*උපලේඛනය*

| *කාර්තුව* | *අවසාන දිනය* | *වට්ටම් සඳහා හිමිකම් ලබා අවසන් දිනය* |
|---|---|---|
| I වන කාර්තුව | 2013.03.31 | 2013.01.31 |
| II වන කාර්තුව | 2013.06.30 | 2013.04.30 |
| III වන කාර්තුව | 2013.09.30 | 2013.07.31 |
| IV වන කාර්තුව | 2013.12.31 | 2013.10.31 |

09-466

---

**හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 සහ 24(1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වැනි වගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳ ප්‍රාදේශීය පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාල ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් හෝ යම් විරුද්ධතාවයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 25(3) යටතේ උපලේඛනයේ සඳහන් මංමාවත් ප්‍රාදේශීය සභාව සතු මාර්ග හා මංමාවත් වශයෙන් ස්ථිර වශයෙන් සළකා පාලනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. ආනන්ද ජයවිලාල්,
සභාපති,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2012ක් වූ අගෝස්තු මස 27 වැනි දින,

මාර්ගයේ නම - පොල්වත්ත ඩිංගිරියාදෙණිය පාර
ආරම්භය - පහල කොණ්ඩදෙනිය ජල ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය
අවසානය - ආර්. බී. පී. බණ්ඩාර මැණිකේගේ නිවස අසලින්

මායිම් -

| වම් පස | දකුණු පස | දිග (අඩි) | පළල (අඩි) |
|---|---|---|---|
| ජල ව්‍යාපෘති ඉඩම<br>පී. එල්. එස්. බණ්ඩාරට අයත් මැදහින්න වත්ත | ජල ව්‍යාපෘති ඉඩම<br>පී. එල්. එස්. බණ්ඩාරට අයත් මැදහින්න වත්ත<br>එම්. බී. විල්ප්‍රඩ්ට අයත් මැදහින්න වත්ත<br>නවරත්න මැණිකේට අයත් මැදහින්න වත්ත<br>බී. පී. මුතු බණ්ඩාට අයත් මැදහින්න වත්ත<br>කේ කනකසුන්දරිට අයත් මැදහින්න වත්ත | 984 | 10 |
| පාලිතරත්නට අයත් මැදහින්න වත්ත<br>ආර්. බී. පී. බණ්ඩාර මැණිකේට අයත් මැදහින්න වත්ත | | | |

මාර්ගයේ නම - අත්තරගම කාබරංග ඇල මාර්ගය
අත්තරගම බෝතොට ප්‍රධාන මාර්ගයේ සිට අත්තරගම සොහොන්කොත් දක්වා යන මාර්ගයේ ඉතිරි කොටස
මායිම් -

| වම් පස | දකුණු පස | දිග (අඩි) | පළල (අඩි) |
|---|---|---|---|
| බී. ජී. අශෝකාට අයත් කාබරංග ඇල ඉඩම | බී. පී. අශෝකාට අයත් කාබරංග ඇල ඉඩම<br>සුමිත් බණ්ඩාර දිසානායකට අයත් කහවත්ත කුඹුර මායිම<br>ඊ. එම්. පී. එස්. කේ. හේරත්ට අයත් දොඩම්ගස් පැලේ කුඹුර හා දෙල්ගහ පැල ගොඩ ඉඩම<br>එච්. එම්. බණ්ඩාර මැණිකේට අයත් දෙල්ගහ පැල කුඹුර<br>ආර්. එම්. සෙනවිරත්නට අයත් දෙල්ගහපැල යායේ මැද පැල කුඹුර | 1000 | 6 |

මාර්ගයේ නම - යටිහලගල බරිගම පාරේ සිට කාන්ගරන්මුල්ල වත්ත හරහා සුමනතිස්ස කණිෂ්ඨ විද්‍යාලය දක්වා දිව යන අඩි පාර ඉතිරි කොටස
මායිම් -

| වම් පස | දකුණු පස | දිග (අඩි) | පළල (අඩි) |
|---|---|---|---|
| පී. පී. අනුලාවතීට අයත් කාංගරන්මුල්ල වනාත හා කුඹුර<br>යූ. ජී. ආර්. වර්ණතිලකට අයත් කාංගරන්මුල්ල කුඹුර<br>කේ. පී. ධර්මසේනට අයත් කාංගරන්මුල්ල කුඹුර | කේ. ඇම්. ජී. සමරසිංහට අයත් කාංගරන්මුල්ල වත්ත<br>කේ. ඒ. ජී. චන්ද්‍රාට අයත් කාංගරන්මුල්ල ගෙදර ඉඩම | 278 | 06 |

1996.4.11 *ගැසට් පත්‍රයේ* "ආ" කොටසේ ප්‍රසිද්ධ කරන ලද තලපැලැල්ලේ මාතලේ ගෙදර පාර වෙනුවට සංශෝධිත නව මාර්ගය 603 බස් ධාවන මාර්ගයේ කී. මී. 9 කණුව ඉදිරිපසින් ආරම්භ වී අඹගහදෙණිය කුඹුරු යායෙන් අවසන් වන මාර්ගය කහටගස්අංගේ කුඹුර හරහා මාතලේ ගෙදර වත්ත පාර
මායිම් -

| වම් පස | දකුණු පස | දිග (අඩි) | පළල (අඩි) |
|---|---|---|---|
| අයි. ඒ. අබේරත්නට අයත් කහටගස්අංගේ කුඹුර | අයි. ඒ. අබේරත්නට අයත් දන්තුරයා ගෑණිගේ වත්ත | 750 | 10 |
| අයි. ඒ. අබේරත්නට අයත් කහටගස්අංගේ කුඹුර | අයි. ඒ. අබේරත්නට අයත් කහටගස්අංගේකුඹුර<br>ටී. බී. අත්තනායකට අයත් කහටගස්අංගේ කුඹුර | | |
| ඩබ්. ඩී. රණසිංහ බණ්ඩාරට අයත් කහටගස්අංගේ කුඹුර<br>ඩබ්. පී. එස්. තිලකරත්නට අයත් කහටගස්අංගේ කුඹුර | ආර්. ආර්. ජේ. යසවතීට අයත් කහටගස්අංගේ කුඹුර | | |

09-709

## කටුනායක - සීදූව නගර සභාව

මහජන පුස්තකාල සඳහා වූ අතුරු ව්‍යවස්ථාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1281 දරන *ගැසට් පත්‍රයේ* iv වන කොටසේ 2005.02.18 වැනි දින පළාත් සභා නිවේදන යටතේ බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයයභාර අමාත්‍යතුමන් විසින් 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත යටතේ නගර සභාවන්හි මහජන පුස්තකාල සඳහා වූ අතුරු ව්‍යවස්ථාව කෙටුම්පත් කර ප්‍රකාශයට පත්කර ඇත. බස්නාහිර පළාතේ සියලු පළාත් පාලන ආයතනවලට එය පිළිගැනීමට අදාල බලය ද එමගින් ලබාදී ඇත.

එකී කෙටුම්පතේ අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථා සෑදීමට 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 157 වන වගන්තිය සමග කියවිය යුතු 154 වගන්තිය මගින් නගර සභාවලට බලය පැවරී ඇති බලතල ප්‍රකාරව ගරු විෂයය භාර අමාත්‍යතුමාගේ ඉහත බලයදීම යටතේ එකී *ගැසට් පත්‍රයේ* පළකර ඇති නගර සභා මහජන පුස්තකාල සඳහා වූ අතුරු ව්‍යවස්ථා කෙටුම්පත කටුනායක - සීදූව නගර සභා මහජන පුස්තකාල තුල ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගැනීම සුදුසු බව 2012.05.29 වැනි දින පැවති මහ සභා රැස්වීමේ දී ඒකමතිකව සභා සම්මත විය.

ඒ අනුව 2012.06.01 වැනි දින සිට එකී අතුරු ව්‍යවස්ථාව කටුනායක - සීදූව නගර සභා මහජන පුස්තකාල පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගත් බව සියලු දෙනා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලලන්ත ගුණසේකර,
සභාපති,
කටුනායක - සීදූව නගර සභාව.

2012 ජූනි මස 01 වැනි දින,
කටුනායක - සීදූව නගර සභාව,
සීදූව.

09-496

---

## මාවනැල්ල ප්‍රාදේශීය සභාව

1975 අංක 17 දරන සමාජ ශාලාවට බලපත්‍ර දීමේ පනත

මෙහි වූ උපලේඛනයේ නම් සඳහන් තැනැත්තා විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාව එහි සඳහන් ස්ථානයේ පැවැත්වීම සඳහා 2013 වර්ෂයට බලපත්‍රයක් ලබාගැනීමට මා වෙත ඉල්ලුම් පතක් ඉදිරිපත් කර ඇති බව 1975 අංක 17 දරන සමාජ ශාලාවට බලපත්‍ර දීමේ පනතේ 06 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී ශාලාව අසල හෝ එකී ශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය අසල පදිංචි යම් තැනැත්තෙකු එම සමාජ ශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති හතරක් ඇතුලත විරුද්ධත්වයට හේතු දක්වමින් පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලක් මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

එම්. එස්. එම්. කාමෙල්,
සභාපති,
මාවනැල්ල ප්‍රාදේශීය සභාව.

2012 සැප්තැම්බර් මස 05 වැනි දින,
මාවනැල්ල ප්‍රාදේශීය සභාව.

*උපලේඛනය*

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *සමාජ ශාලාවේ සභාපති ද, ලේකම් ද, කළමණාකරු ද යන වග* | *සමාජ ශාලාවේ නම* | *සමාජ ශාලාව පවත්වාගෙන යාමට බලාපොරොත්තු වන ස්ථානය* |
|---|---|---|---|
| එස්. ජී. විජේවර්ධන මයා 21/3, වලව්වත්ත මාවනැල්ල | ලේකම් | මාවනැල්ල විනෝද ක්‍රීඩා සමාජය | මාවනැල්ල රන්කොද්දිවල වසමේ අංක 05 දරන බණ්ඩාරවත්ත නැමැති ස්ථානය |

09-655

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.